Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## ශ්‍රී ලංකා නාවික හමුදාව

### ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ ඉඳුරාම නිලධාරීන් සහ නිලධාරිනියන් සඳහා පුරප්පාඩු - 2022

1. ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ නිලධාරීන් සහ නිලධාරිනියන් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් ඇබෑර්තු සඳහා පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අ. **විධායක නිලධාරි**

නිලය - වැඩ බලන උප ලුතිනන් (පිරිමි/කාන්තා)
සුදුසුකම් - ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.
වයස - අවුරුදු 30ට අඩු විය යුතු ය.

ආ. **මෝටර් රථ ඉංජිනේරු නිලධාරි**

නිලය - ලුතිනන් (පිරිමි)
සුදුසුකම් - ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයකින් යාන්ත්‍රික/නිෂ්පාදන ඉංජිනේරු විද්‍යාව සම්බන්ධව මූලික උපාධියක් ලබා තිබීම.

*හෝ*

- වෙනත් ඕනෑම පිළිගත් විශ්වවිද්‍යාලයකින් යාන්ත්‍රික/නිෂ්පාදන/මෝටර් කාර්මික ඉංජිනේරු විද්‍යාව සම්බන්ධව විද්‍යාවේදී උපාධියක් සමගින් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සාමාජිකත්වය (AMIE) ලබා තිබීම.

*හෝ*

- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සාමාජිකත්වය (AMIE) සඳහා වූ විභාගයේ I වන අදියර සහ II වන අදියර සම්පූර්ණකර තිබීම.

වයස - අවුරුදු 30 ට අඩු විය යුතු ය.

ඇ. **කෘෂි නිලධාරි**

නිලය - උප ලුතිනන් (පිරිමි)
සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂි විද්‍යාව සම්බන්ධව විද්‍යාවේදී විශේෂ උපාධියක් (වැවිලි කළමණාකරණ/භෝග විද්‍යාව/උද්‍යාන විද්‍යාව හා භූමි අලංකරණය යන අංශයන්ගෙන්) ලබා තිබීම.
- කෘෂි කර්මාන්තයට අදාල අංශයන් හි ඇති සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

වයස - අවුරුදු 30 ට අඩු විය යුතු ය.

ඈ. **නීති නිලධාරි**

නිලය - ලුතිනන් (පිරිමි/කාන්තා)
අධ්‍යාපන - නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.
- එම ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම.
වයස - වයස අවුරුදු 30 ට අඩු විය යුතු ය.

ඉ. **වාස්තු විද්‍යා නිලධාරි**

නිලය - ලුතිනන් කොමාණ්ඩර් (පිරිමි/කාන්තා)
සුදුසුකම් - වරලත් සැලසුම් ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකා සැලසුම් ශිල්පීය ආයතනයේ ලියාපදිංචි වී තිබීම.
- වරලත් සැලසුම් ශිල්පියෙකු ලෙස වසර 1 ක පළපුරුද්ද.
වයස - අවුරුදු 35 ට අඩු විය යුතු ය.

ඊ. **ඉංග්‍රීසි භාෂා උපදේශක නිලධාරි**

| | | |
|---|---|---|
| නිලය | - | උප ලුතිතන් (පිරිමි/කාන්තා) |
| සුදුසුකම් | - | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම සහ රජයේ/පෞද්ගලික පාසලක හෝ පිළිගත් රජයේ/පෞද්ගලික ආයතනයක ශාස්ත්‍රීය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සම්බන්ධව වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම. |
| | | හෝ |
| | - | ගුරු පුහුණු විද්‍යාලයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ලබාගත් ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ රජයේ/පෞද්ගලික පාසලක හෝ පිළිගත් රජයේ/පෞද්ගලික ආයතනයක ශාස්ත්‍රීය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සම්බන්ධව වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම. |
| | | හෝ |
| | - | ඉංග්‍රීසි විෂය සම්බන්ධව උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම සහ රජයේ/පෞද්ගලික පාසලක හෝ රජයේ/පිළිගත් පෞද්ගලික ආයතනයක ශාස්ත්‍රීය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සම්බන්ධව වසර 05ක පළපුරුද්දක් ලබා තිබීම. |
| | - | ඉහත එක් සුදුසුකමක් සමඟ පහත එක් සුදුසුකමක් සපුරා තිබිය යුතු ය.<br>(1) TET පරීක්ෂණය සමත්වීම.<br>(2) CELTA සහතිකය ලබාතිබීම.<br>(3) TESOL සහතිකය ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 35ට අඩු විය යුතු ය. |

උ. **මනෝවිද්‍යා උපදේශක නිලධාරි**

| | | |
|---|---|---|
| නිලය | - | උප ලුතිනන් (පිරිමි/කාන්තා) |
| සුදුසුකම් | - | මනෝවිද්‍යා උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම. |
| | - | මනෝවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම. |
| | - | මනෝවිද්‍යා උපදේශනය සම්බන්ධයෙන් පිළිගත් ආයතනයක හෝ රෝහලක වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම. |
| | - | මනෝවිද්‍යා උපදේශනය/මනෝ විද්‍යාව සම්බන්ධයෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදරා තිබීම අමතර සුදුසුකමක් වේ. |
| වයස | - | අවුරුදු 35ට අඩු විය යුතු ය. |

ඌ. **භාෂා පරිවර්තක නිලධාරි**

| | | |
|---|---|---|
| නිලය | - | උප ලුතිනන් (පිරිමි/කාන්තා) |
| සුදුසුකම් | - | ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| | - | දිවුරුම් දුන් භාෂා පරිවර්තකයෙකු ලෙස අධිකරණ අමාත්‍යාංශයේ ලියාපදිංචි වී තිබීම. |
| | - | වසර 2ක පළපුරුද්ද. |
| වයස | - | අවුරුදු 35 ට අඩු විය යුතු ය. |

එ. **හෙද උපදේශක නිලධාරි**

| | | |
|---|---|---|
| නිලය | - | ලුතිනන් (පිරිමි/කාන්තා) |
| සුදුසුකම් | - | පිළිගත් ආයතනයකින් පවුල් සෞඛ්‍ය/මනෝචිකිත්සක හෙදසේවය ඉගැන්වීම සහ අධීක්ෂණය පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| | - | පිළිගත් හෙද පුහුණු විදුහලක හෙද උපදේශක නිලධාරියෙකු ලෙස වසර දෙකක පළපුරුද්ද |
| වයස | - | අවුරුදු 35ට අඩු විය යුතු ය. |

ඒ. **අරමුදල් කළමනාකාර නිලධාරි**

| | | |
|---|---|---|
| නිලය | - | ලුතිනන් කොමාණ්ඩර් (පිරිමි/කාන්තා) |
| සුදුසුකම් | - | විද්‍යාවේදී උපාධියක් සහ ව්‍යාපාර කළමණාකරණය පිළිබඳව ආචාර්ය උපාධියක් ලබා තිබීම. |
| | - | මූල්‍ය ආයෝජනය සම්බන්ධව පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| වයස | - | වයස අවුරුදු 35ට අඩු විය යුතු ය. |

ඔ. **පශු වෛද්‍ය නිලධාරීන්**

| | | |
|---|---|---|
| නිලය | - | ලුතිනන් (පිරිමි/කාන්තා) |
| සුදුසුකම් | - | පශු වෛද්‍ය විද්‍යාව සම්බන්ධව උපාධියක් ලබා තිබීම. |
| | - | ශ්‍රී ලංකා පශු වෛද්‍ය සංගමයේ ස්ථිර සාමාජිකත්වය ලබා තිබීම. |
| වයස | - | වයස අවුරුදු 35ට අඩු විය යුතු ය. |

3. අනෙකුත් සුදුසුකම්.-අයදුම්කරුවන් ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන් ම සපුරාලිය යුතු ය.

| | | | |
|---|---|---|---|
| (අ) | පුරවැසිභාවය | - | ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි. |
| (ආ) | වයස | - | අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඒ ඒ අංශයන් යටතේ දක්වා ඇති පරිදි විය යුතු ය. |
| (ඇ) | උස | - | පිරිමි - අඟල් 65 ට නොඅඩු විය යුතු ය.<br>කාන්තා - අඟල් 63 ට නොඅඩු විය යුතු ය. |
| (ඈ) | බර | - | පිරිමි - කිග්‍රෑ. 52 ට නොඅඩු විය යුතු ය.<br>කාන්තා - කිග්‍රෑ. 41 ට නොඅඩු විය යුතු ය. |
| (ඉ) | පපුව | - | පිරිමි අඟල් 32ට නොඅඩු විය යුතු ය. |
| (ඊ) | වර්ණ දෘෂ්ඨිය | - | එස්ටීඩී II. (නිසි පෙනුම) |
| (උ) | දෘෂ්ඨි තීක්ෂණත්වය | - | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස්/අක්ෂි කාච රහිතව) |
| (ඌ) | අධ්‍යාපන සුදුසුකම් | - | අ.පො.ස. සාපෙළ විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී ගණිතය, මව් භාෂාව සහ ඉංග්‍රීසි විෂයන්වලට සම්මාන (C) සාමාර්ථ ලබා තිබිය යුතු ය. |
| | | - | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන අ.පො.ස උසස්පෙළ විභාග සහතිකයේ ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබිය යුතුය. (විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද උසස්පෙළ විභාග සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය.) |
| (එ) | සිවිල් තත්ත්වය | - | විවාහක/අවිවාහක |

4. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ට දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ. තව ද, දැනටමත් රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියාවේ නියුතු අයදුම්කරුවන් සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් ලබාදෙනු ලැබේ.

5. ඉහත සඳහන් 2 සහ 3 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා නොමැති අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, වයස ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම්වලට අනුව උස, වයස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවකුගේ උස සහ වයස නියමිත පරිදි නොමැති වුව ද නාවික හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඔහුට/ ඇයට ඇත්නම් සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ.

6. සේවා කොන්දේසි :

අ. අපේක්ෂකයින් ස්වේච්ඡා නාවික හමුදාවේ නිලධාරි/ නිලධාරිනි තනතුරු සඳහා බඳවා ගනු ලබන අතර, ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ. පාඨමාලාවේ කාලය බඳවාගනු ලබන ඒ ඒ අංශය අනුව වෙනස් වේ.

ආ. ශ්‍රී ලංකා නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශයක පුහුණුව ලැබීම සඳහා බඳවාගනු ලබන නිලධාරින් /නිලධාරිනියන් සූදානමින් සිටිය යුතුයි.

ඇ. සියලුම නිලධාරින්/ නිලධාරිනියන් රාජකාරි හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් විය යුතු ය.

ඈ. පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන් පසුව නිලධාරින්/ නිලධාරිණියන් ශ්‍රී ලංකා නාවික හමුදා නීතියට යටත් විය යුතුයි.

ඉ. අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළ දී යම් නිලධාරියකු/නිලධාරිණියක හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත්, ශ්‍රී ලංකා ජනරජය මගින් එම නිලධාරියා/ නිලධාරිණිය වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම නිලධාරියා/නිලධාරිණිය විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

ඊ. පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි නිලධාරියකුගේ/ නිලධාරිණියකගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු/ ඇය අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ නිලධාරියා/ නිලධාරිණිය විසින් එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලු වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමඟ ගිවිසුමකට හා බැඳුම්කරයට ඇතුළත් විය යුතුයි.

උ. පුහුණුව ලබන කාලසීමාව තුළ නිලධාරින්/ නිලධාරිණියන් හට නිලධාරි නිවාස තුළින් නේවාසික පහසුකම් සහ ආහාර සපයනු ලැබේ.

ඌ. විවාහක නිලධාරින්/ නිලධාරිනියන් සඳහා විවාහක නිවස්නයන්හි පවතින පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුළිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

7. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා : තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

8. වැටුප් හා දීමනා :

2020.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ.

| විස්තරය | වැඩ බලන උප ලුතිනන් (රු.) | උප ලුතිනන් (රු.) | ලුතිනන් (රු.) | ලුතිනන් කොමාණ්ඩර් (රු.) |
|---|---|---|---|---|
| මූලික වැටුප | 41,905.00 | 47,615.00 | 55,625.00 | 60,965.00 |
| ජීවන වියදම් දීමනාව | 7,800.00 | 7,800.00 | 7,800.00 | 7,800.00 |
| නිළ ඇඳුම් දීමනාව | 525.00 | 525.00 | 525.00 | 525.00 |
| දුෂ්කර ලැගුම් දීමනාව | 600.00 | 600.00 | 600.00 | 600.00 |
| අමතර දීමනාව | 1,000.00 | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| විශේෂ අමතර දීමනාව | 3,000.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| එකතුව | 54,830.00 | 60,540.00 | 68,550.00 | 73,890.00 |

අ. ආහාර දීමනාව ආහාරයෙන් බැහැර නිලධාරින්/නිලධාරිනියන් සඳහා පමණක් හිමිවේ.

ආ. සුදුසුකම් වැටුප අදාළ පරිදි මසකට උපරිම රු.637.50 ක් ගෙවනු ලැබේ.

ඇ. නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නිලධාරියාට/නිලධාරිනියට, කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

ඈ. කඳවුරු තුළ වාසය කරන නිලධාරින්ට/ නිලධාරිනියන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට රාජකාරි නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

ඉ. නිළ ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලයේ සපයනු ලැබේ.

ඊ. නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ (අදාළ පරිදි නිලධාරියාට/නිලධාරිනියට කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට).

උ. රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරීන්ට/ නිලධාරිනියන්ට රු.3,200.00 සිට රු.7,700.00 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමි වේ.

9. **අයදුම්කරුවන්ට උපදෙස් :**

අ. පහතින් දක්වා ඇති ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2022 ජුනි මස 05 දින දහවල් 1200 ට ප්‍රථම ලැබෙන සේ "ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවාගැනීම්), ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, තැ. පෙ. 593, කොළඹ 01" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ "ඉඳුරාම බඳවා ගැනීම - ස්වේච්ඡා නිලධාරීන්/නිලධාරිනියන්"යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-7195118/ 011-7195120/011-7195120 මගින් ලබා ගත හැක.

ආ. රාජ්‍ය සේවයේ (දෙපාර්තමේන්තු / සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්) හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා (දෙපාර්තුමේන්තුවේ /සංස්ථාවේ/ මණ්ඩලයේ / සිවිල් ආයතනයේ) මගින් ඉදිරිපත් කළ යුතු ය.

ඇ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලුම්පත් යොමු කිරීමේ දී මෙම ලියකියවිලිවල සහතික කරන ලද ඡායාපිටපත් අමුණා එවිය යුතු ය.

(1). උප්පැන්න සහතිකය.

(2). අයදුම් කර ඇති අංශයන්වලට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන/උසස් අධ්‍යාපන/වෘත්තීය අධ්‍යාපන/උපාධි සහතික.

(3). පාසල් හැරයාමේ සහතිකය සහ පාසලෙන් ලබාගත් චරිත සහතිකය.

(4). මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය.

(5). පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(6). මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක් (අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටින වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් විය යුතු ය).

(7) ක්‍රීඩා හා වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

ඈ. නියම කරන ලද අවස්ථාවන්හිදී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඉ. වෙනත් ලියකියවිලි හෝ ලේඛනවල මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතු ය.

ඊ. අයදුම්පත සමඟ සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

10. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය දඬුවම් සහිතව සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

11. **තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ :**

අ. ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. එම පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරණු ලබයි.

ආ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා අවශ්‍යතා;

| වයස් කාණ්ඩය (අවුරුදු) | ස්ත්‍රී පුරුෂ භාවය | PUSH UPS (මිනිත්තු 2ක් තුළ) | CURL UPS (මිනිත්තු 2ක් තුළ) | කි. මී. 2.4 දුර දිවීම (මිනිත්තු) |
|---|---|---|---|---|
| 18 - 24 | පුරුෂ | 27 | 25 | 11 |
| | ස්ත්‍රී | 11 | 19 | 12 |
| 25 - 29 | පුරුෂ | 24 | 23 | 13 |
| | ස්ත්‍රී | 9 | 17 | 15 |
| 30 - 34 | පුරුෂ | 20 | 21 | 15 |
| | ස්ත්‍රී | 8 | 15 | 17 |
| 35 - 39 | පුරුෂ | 18 | 19 | 16 |
| | ස්ත්‍රී | 7 | 13 | 18 |

ඇ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් එදිනම මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන අතර, එයින් සමත් වන අයදුම්කරුවන් පමණක් දෙවන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි. දෙවන සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලබන අතර, එම පරීක්ෂණයේදී ලබා ගන්නා ලද ලකුණු සහ පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත ඒ ඒ අංශයෙන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණක් බඳවාගනු ලැබේ.

ඈ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ලිපිනයට ලිඛිතව තැපැල් මඟින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

ඉ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

ඊ. අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

උ. අයදුම්කරුවෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට/ ඇයට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සහ කිරීම, එම අයදුම්කරු නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේය.

ඌ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

***සටහන.***- මෙම *ගැසට්* නිවේදනය සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා ද්විත්වයෙන්ම පළවේ. සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

ඩීඑන්එස් උළුගේතැන්න, ආර්එස්පී*, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී
වයිස් අද්මිරාල්
ශ්‍රී ලංකා නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ. පෙ. 593,
කොළඹ 01.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවට ඉඳුරාම බඳවා ගන්නා නිලධාරීන්/නිලධාරිණියන් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :——————————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. ඉල්ලුම් කරන තනතුර :——————————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :——————————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.

5. ස්ථිර ලිපිනය :——————————.

6. තැපැල් ලිපිනය :——————————.

7. විද්‍යුත් ලිපිනය :——————————.

8. උපන් දිනය :——————————.

9. වයස ඃ අවුරුදු ......., මාස ......., දින ....... (2022 ජුනි මස 05 වැනි දිනට)

10. උස ............(අඟල්) පපුව ........(අඟල්) බර ........(කි. ග්‍රෑ.)

11. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :——————————.

12. දිස්ත්‍රික්කය :——————————.

13. ඡන්ද කොට්ඨාසය :——————————.

14. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——————————.

15. දුරකථන (whatsapp) අංකය:——————————.

16. විවාහක/අවිවාහක බව:——————————.

17. ස්ත්‍රී / පුරුෂ භාවය:——————————.

18. අධ්‍යාපනය ලැබූ පාසල් :——————————.

19. පාසල සහ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර:——————————.

| *පාසලේ/විශ්වවිද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) | | |
| | අ.පො.ස. (උ.පෙළ) | | |
| | වෙනත් | | |

20. පාසලෙන් / විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |
| | | | |
| | | | |

21. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :———.

23. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න) :———.

24. පාසලේ/විශ්වවිද්‍යාලයේ/බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :———.

25. සන්නද්ධ සේවා/ස්වේච්ඡා බල සේනාවේ/ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය :———.

26. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලුම් කර තිබේ ද? එසේනම් ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න :———.

27. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ අත්හිටවූ සිර දඬුවමක් ලබා තිබේ ද? එසේනම් විස්තර සඳහන් කරන්න :———.

28. රාජ්‍ය අංශයෙහි දෙපාර්තමේන්තුවක/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකුව, රාජ්‍ය බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර/ සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :———.

29. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

30. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා අදාළ වන රෙගුලාසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.